# පුද්ගල පෞරුෂය වර්ධනය කෙරෙහි ප්‍රාථමික සමාජානුයෝජනය තුළින් සිදුවන බලපෑම

එම්. ඒ. එම්. සඳමාලි[1]

**සංක්ෂේපය**

ඕනෑම සමාජයක විධිමත් සැකැස්ම පවුල මගින් නිරූපණය කරයි. සමාජය තුළ පවතින සංස්ථා ලෙස පවුල් සංස්ථාව, අධ්‍යාපන සංස්ථාව, ආර්ථික සංස්ථාව, දේශපාලන සංස්ථාව, ආගම, නීතිය යන සංස්ථා එකිනෙකට සම්බන්ධ වන අතර එක් සංස්ථාවක් බිඳ වැටීම අනෙකුත් සංස්ථා කෙරෙහි විවිධ ලෙස බලපානු ලබයි. ඒ අනුව ශ්‍රී ලාංකේය සමාජය තුළ පවුලේ කාර්යභාරය හඳුනා ගැනීමට මෙම අධ්‍යයනය ඉතා වැදගත් වී ඇත. පුද්ගලයෙකු සතුව ඇති "මා", "මාගේ", "තමා", යන හැගීම් ගොඩනැගීමට සමාජානුයෝජනය අවශ්‍ය වේ. මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය වූයේ ප්‍රාථමික සමාජානුයෝජන ක්‍රියාවලිය තුළින් පුද්ගල පෞරුෂය ඉහළ නැංවීමත්, ඒ තුළින් සමාජ ප්‍රගමනයට සියළු දෙනා දායක කර ගන්නේ කෙසේ දැයි හඳුනා ගැනීමත් ය. එහි දී ප්‍රධාන අරමුණු ලෙස, පෞරුෂ වර්ධනයට කුඩා කළ සිට නිසි සමාජානුයෝජනයක් අවශ්‍ය බව පෙන්වා දීම, පවුල තුළින් සිදුවන අපගාමී චර්යාවන් සමාජයට ඇති කරන බලපෑම අධ්‍යයනය කිරිම, පවුල් සංස්ථාවේ විවිධ බලපෑම් තුළින් පුද්ගල පෞරුෂයට ඇතිවන බලපෑම අධ්‍යයනය කිරිම සහ සමාජ වෙනස් වීමට සාපේක්ෂව පුද්ගලයාගේ කාර්යභාරය වෙනස් වී දැයි අධ්‍යයනය කිරිමය. මෙම අධ්‍යයනය සඳහා මුලටියන ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාකඳුර-නැගෙනහිර යන ග්‍රාම නිලධාරී වසම යොදා ගනු ලැබීය. දත්ත රැස් කිරීම සඳහා සම්මිශ්‍රත ක්‍රමය යොදා ගත් අතර ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කරනු ලැබීය. නියැදිය ලෙස සසම්භාවි නියදි ක්‍රමයක් වන සරළ සසම්භාවි නියදි ක්‍රමය යටතේ පවුල් 50 කින් ලබාගත් දත්ත විස්තරාත්මක සංඛ්‍යානය යටතේ විශ්ලේෂණය කරන ලදි. මෙම පර්යේෂණයේ නිගමනය වන්නේ පෞරුෂය වර්ධනයට කුඩාකළ සිට ම නිසි සමාජානුයෝජනයක් පවුල තුළින් ලැබීම මගින් යහපත් ස්වීයත්වයකින් යුතු පුද්ගලයින් බිහි වේ. එසේ නොමැති වූ විට අපගාමී චර්යාවන් වලට යොමු වන පුද්ගලයින් හඳුනා ගත හැකිය. පුද්ගල ආකල්ප වර්ධනය, මානසික ආතති කළමනාකරණය, ධනාත්මක පෞරුෂ ලක්ෂණ ගොඩනගා ගැනීම, නායකත්වය ප්‍රගුණ කිරීම, ආත්මය ගොඩනගා ගැනීම ජීවත්වන පරිසරය මෙන්ම සාර්ථක ජීවිතයක් ගොඩනගා ගැනීමට අත්‍යාවශ්‍ය සාධක පැවතිය යුතු බව නිගමනය කළ හැකිය. යම් රටක සමාජය ශක්තිමත් කිරිමට නම් යහපත් ස්වීයත්වයකින් හෙබි ගුණ ගරුක සමාජයකට පවුල් සංස්ථාව ශක්තිමත් විය යුතු ය. ඒ තුළින් මනා කායික හා මානසික වර්ධනයක් සේම පෞරුෂත්වයක් සහිත පුද්ගලයින් බිහි වනු ඇත.

**මුඛ්‍ය පදඃ** *පුද්ගලයා, පවුල, සමාජානුයෝජනය, පෞරුෂය, සමාජ ප්‍රගමනය*

## 1.0 හැඳින්වීම

පුද්ගලයින් තුළ අන්‍යෝන්‍ය රඳා පැවැත්මත් තම යුතුකම් හා වගකීම් පිළිබඳ හැඟීමක් වර්ධනය කිරීමත් නිසා සමාජානුයෝජනය පුද්ගල පෞරුෂය වර්ධනය වීම සිදු වේ. සමාජයේ සාමාජිකයෙකු වන මිනිසා සමාජානුයෝජනය වීම තුළ ආගම, ජාතිය, කුල, සිරිත්-විරිත්, නීතිරීති, ප්‍රතිමාන හා ධර්මතා ආදි සංස්කෘතික ලක්ෂණයන් ඉගෙනීම තුළින් සමාජයේ අන්තර් සම්බන්ධතා වර්ධනය කර ගැනීමට ඉවහල් වේ. තවද සමාජයෙන් සමාජයට, සංස්කෘතියෙන් සංස්කෘතියට මෙම සමාජානුයෝජනය ක්‍රියාවලිය වෙනස් වේ. උදාහරණයක් දක්වන්නේ නම් පෙරදිග සමාජවල දරුවන් සමාජානුයෝජනය කිරීමේ දී ඉතා දීර්ඝ කාලයක් මව සහ පවුලේ සාමාජිකයින් සමඟ එකට ජීවත් වන අතර බාහිර


[1] සමාජවිද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, manojimunasinghe@gmail.com

සමාජය පිළිබඳ විමසීමේ දී එය බොහෝ සෙයින් වෙනසකට භාජනය වන බව හඳුනා ගත හැකිය. පුද්ගලයා සමාජයේ ජීවත් වීමට පටන් ගැනීමේ දී සමාජය පිළිබඳ බොහෝ කරුණු දත යුතුවීම අත්‍යාවශ්‍ය වේ. සමාජය සංකීර්ණ වූ ජන සබඳතා රාශියකින් සමන්විත වූ ඒකකයකි. එහි තැනුම් ඒකකය වන්නේ පවුලයි. කිසියම් සමාජයක උපත ලබන පුද්ගලයෙකු තමා අයත් වන සමාජයේ සමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීමට එම නීතිරීති හා භාවිතයන් ඉගෙනීම තුළින් සමාජානුයෝජනය ලක් වේ. එය පුද්ගලයාගේ ශික්ෂණය හා පෞරුෂය ගොඩනැගීමට මෙන් ම සමාජ ජීවිතය සකස් කර ගැනීමට ද වැදගත් වේ.

මිනිසා කේන්ද්‍ර කරගත් සමාජය පිළිබඳ විද්‍යාත්මකව හැදෑරීමේ දී සමාජානුයෝජනය වැදගත් සංකල්පයක් වේ. ළදරුවෙකු මෙලොව උපත ලැබූව මොහොතේ සිට ඔහු තුළ සහජාසයක් නොපවතින හෙයින් ස්වභාවික සත්ත්වයෙකු ලෙස ජීවත් වේ. තම මවගේ හා සෙසු සාමාජිකයන්ගේ යම් යම් ක්‍රියාකාරකම් හේතුවෙන් ස්වභාවික මිනිසෙකු ලෙස උපත ලබන දරුවා සාමාජික මිනිසෙකු බවට පරිවර්තනය වේ. මෙම තත්ත්වය සමාජ විද්‍යාවේ ස්වභාවික මිනිසා සහ සමාජීය මිනිසා ලෙස අර්ථ දැක්වේ. මිනිසා කේන්ද්‍ර කොට ගත් මෙම සමාජානුයෝජනය ක්‍රියාවලිය එක් පරම්පරාවක සිට තවත් පරම්පරාවකට සංස්කෘතිය සමාජානුයෝජනය හරහා ආරෝපණය වන අතර පුද්ගලයා සමාජමය වශයෙන් අන්‍යෝන්‍ය ක්‍රියාවන් ඇති කර ගැනීමක් සිදු වේ. සමාජානුයෝජනය යනු දෙයාකාර ක්‍රියාදාමයකි. එනම් සංස්කෘතියේ අන්තර්ගතය තුළ පවතින ඉගෙනීමේ ක්‍රියාවලිය මඟින් පෞරුෂත්වය දියුණුකර ගැනීම, එම සංස්කෘතිය පරම්පරාවෙන් පරම්පරාවට ව්‍යාප්ත කරවීමේ ක්‍රියාදාමයට එක් වීම(රත්නපාල, 1986).

සමාජ විද්‍යාඥයෙකු වන රැල්ෆ් ලින්ටන් (Ralph Linton) දක්වනුයේ උපතේ දී පුද්ගලයාට පෞරුෂත්වයක් නොමැති බවත් ස්වභාවිකව පවත්නා යම් යම් ගුණාංග පමණක් හිමිවන අතර මොළය සහ ස්නායු පද්ධතිය උපයෝගී කොටගෙන අන්තර්ක්‍රියා පැවැත්වීමට පසුබිම ලබා ගන්නා බව හා එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වන බව දක්වා ඇත. සංස්කෘතිය, සමාජය සහ පෞරුෂත්වය සංකල්පය සමාජානුයෝජනය ඇති වීමට බලපාන බව පෙන්වා දී ඇත. එහි සම්බන්ධතාවය රැල්ෆ් ලින්ටන් පැහැදිලි කරන්නේ මෙසේය.

රූපසටහන 01: සමාජානුයෝජනය ඇති වීමට බලපාන සංකල්ප




මූලාශ්‍රය: අමරතුංග (2009)

සමාජය, සංස්කෘතිය හා පෞරුෂත්වය යන සංකල්ප කිසියම් සමාජ ස්ථරයක ජීවත් වන සාමාජිකයින්ගේ චර්යාව හා එම ස්ථරයට ආවේණික වූ ලක්ෂණයන්ගෙන් සමන්විත වේ.

විවිධ සමාජ ස්ථරයන් තුළ පවතින සාරධර්ම, ප්‍රතිමාන එම පුද්ගලයා සමාජානුයෝජනයේ දී වැදගත් වන බව තව දුරටත් පෙන්වා දිය හැකිය.

ටැල්කොට් පාර්සන්ස් (Talcott Parsons) නම් සමාජ විද්‍යාඥයා පවසන පරිදි සමාජයේ බලපවත්නු ලබන පරිදි සමාජයේ බලපවත්වනු ලබන යම් යම් සාරධර්ම, ආකල්ප, අගනාකම්, පිළිබඳ ඉගෙනගෙන ඒවා තමාගේ චරිතය තුළ අභ්‍යන්තරීකරණය කර ගැනීම සමාජානුයෝජනයයි (සුබසිංහ, 2013).

සමාජානුයෝජනයේ දී සිදුවන සමාජයේ පවතින විවිධ තත්ත්වයන් හා කාර්යබාරයෙන් හෙවත් භූමිකා මූලික වශයෙන් පාදක වී ඇත. පුද්ගලයා ස්වභාවිකව නිශ්චිත රාමුවක් වන අතර සමාජ ගති පැවතුම් සංස්කෘතික අංග එකට එකතු කර ගැනීම මඟින් එම නිෂ්ක්‍රිය බව පරිපූර්ණත්වයට පත්කර ගනී. මේ අනුව සමාජය පිළිබඳව උගැන්ම ප්‍රධාන වශයෙන් දෙයාකාරයකින් හඳුනාගත හැකිය. එනම්,

01. ප්‍රාථමික සමාජානුයෝජන (Primary Socialization)
02. ද්විතීයික සමාජානුයෝජන (Secondary Socialization)

කිසියම් සමාජයක සාමාජිකයෙකු බවට පත් වන දරුවා සමාජානුයෝජනයට භාජනය වීමේ දී විවිධ පුද්ගල සමූහයන් සහ සමාජ ආයතන සමාජගත වන පුද්ගලයා කිසියම් බලපෑමක් ඇති කරවනු ලබයි. ඒ අනුව සමාජානුයෝජනය කාරන (Agencies of Socialization) කිහිපයක් හඳුනාගත හැකිය. එනම්, පවුල, පාසල, සමවයස් කණ්ඩායම්, සන්නිවේදන මාධය, උප සංස්කෘතිය යනුවෙනි. සමාජයේ වෙසෙන වැඩිදෙනා විසින් අනුගමනය කරනු ලබන හැසිරීම් රටාව තේරුම් ගැනීම හා ඒ අනුව සමාජයට අනුකූලව හැඩගැසීම හෙවත් සමාජයට අනුයෝජනය වීම සමාජානුයෝජනය ලෙස හැඳින්වේ.

සමාජානුයෝජනය ජීවිතාන්තය දක්වා ම බලපැවැත්වෙන ක්‍රියාවලියක් වන හෙයින් මහ සමාජයේ පැවැත්ම ද අඛණ්ඩව පවතියි. ඇතැම් සමාජ විද්‍යාඥයින් පෙන්වා දෙන පරිදි සමාජ ජීවිතයේ දී සාමාජිකයෝ සමාජ ඇගයුම් වලට අනුකූලව ක්‍රියාකොට තම ප්‍රතිරූපය ගොඩනංවා ගැනීමට වෑයම් කරන බව දක්වා ඇත. සමාජානුයෝජනය වීමට නව සමාජයේ සාමාජිකයින් උනන්දු වෙති. සමාජයක් තුළ ජීවත් වීමේ දී දැන ගතයුතු කරුණු අවප්‍රමාණය දියුණු කරගත යුතු හුරු පුරුදු අසීමිතය. ඒ ඒ සමාජ අවස්ථාවලදී හා දූස් සමාජානුයෝජනය ලෙස හඳුනාගත හැකිය.

මාස්ලෝ විසින් රචිත (Motivation and Personality) කෘතිය හරහා ඔහු මූලික අවශ්‍යතා සන්තර්පණය කර ගැනීමේ අවසාන ඵලය වන්නේ පුද්ගලයා ස්වියත්ව සාක්ෂාත්කරණයට පත් වීමයි. පුද්ගලයා මූලික අවශ්‍යතා ප්‍රධාන ආකාර 05ක් යටතේ මාස්ලෝ දක්වා ඇත. එනම්,

01. කායික අවශ්‍යතා
02. ආරක්ෂක අවශ්‍යතා
03. ස්නේහ අවශ්‍යතා
04. ආත්ම සම්මානන අවශ්‍යතා
05. ආත්ම සාක්ෂාත්කරණ අවශ්‍යතා (සුබසිංහ, 2014).

ස්වියත්වය සෑම පුද්ගලයෙකුටම පොදු වූවක් මෙන්ම නිරන්තරයෙන් වෙනස් වීමට භාජනය වේ. පුද්ගලයා ආත්ම සාක්ෂාත්කරණයට ළඟා වීමට පෙර පසු කළ යුතු අවස්ථා කිහිපයකි. එය මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය මඟින් තව දුරටත් විග්‍රහ කොට ඇත. අවශ්‍යතා සම්පූර්ණ කරමින් ස්වියත්වය වර්ධනය කිරීම පෞරුෂයේ ගතික ප්‍රේරණ බලයක් වශයෙන් මාස්ලෝ දක්වා ඇත.

මානව සමාජය තුළ ජීවත් වන මිනිසා කෙරෙහි බලපානු ලබන සමාජානුයෝජනය ක්‍රියාවලිය පුද්ගල පෞරුෂත්වය නිර්මාණය විෂයෙහි සුවිශේෂ කාර්යයභාර්යක් ඉටු කරනු ලබයි. සමාජ පරිසරය තුළ පවතින සංස්කෘතිය හරහා පුද්ගලයා තමාගේ පෞරුෂත්වය නිර්මාණය කර ගන්නා ආකාරය පිළිබඳ ශ්‍රිතයක් කර්ට් ලෙවින් (Kert Lewin) සහ ඒබ්‍රහම් කාඩිනර් (Abraham Cardiner) ඉදිරිපත් කරයි.

(B= (F) P XE)

B= හැසිරීම (Behaviour)
F= ශ්‍රිතය (Function)
P= පෞරුෂත්වය (Personality)
E= පරිසරය (Environment) (අමරතුංග, 2009).


පුද්ගල චර්යාව කෙරෙහි භෞතික පරිසරයේ බලපෑමක් සිදුවේ. එය පුද්ගලයාගේ පෞරුෂය ගොඩනැඟීමට බලපාන බව දක්වා ඇත. සමාජ පරිසරය හා පෞරුෂත්වය වර්ධනය මේ අයුරින් එකිනෙකට වෙනස් අයුරින් බලපෑම් කරනු ලබන අතර එය මනෝවිද්‍යාඥයින් පරිසරය හා මානසිකව ඇති චිත්තවේගය අනුව වෙනස් වීමට ලක් වී ඇති බව දක්වා ඇත. එය සමාජානුයෝජනය ඉගෙනුම් ක්‍රියාවලියක් බවට ලක් වී ඇත.
ගැටලුවඃ පුද්ගල පෞරුෂය වර්ධනය කෙරෙහි ප්‍රාථමික සමාජානුයෝජනය තුළින් සිදුවන බලපෑම සමාජයට ඇති කරන බලපෑම කෙබඳුද?
පරමාර්ථයඃ ප්‍රාථමික සමාජානුයෝජන ක්‍රියාවලිය තුළින් පුද්ගල පෞරුෂය ඉහළ නැංවීමත්, ඒ තුළින් සමාජ ප්‍රගමනයට සියලු දෙනා දායක කර ගැනීම.
අරමුණුඃ
01. සමාජ ප්‍රගමනය කෙරෙහි සමාජානුයෝජන ක්‍රියාවලිය අත්‍යාවශ්‍ය බව හඳුනාගැනීම.
02. පවුල් සංස්ථාවේ ක්‍රියාකාරිත්වය තුළින් පුද්ගල පෞරුෂයට ඇතිවන බලපෑම අධ්‍යයනය කිරීම.
03. සමාජ විපර්යාසයට සාපේක්ෂව පවුලේ සමාජිකයන්ගේ කාර්යභාරය වෙනස් වී ඇති ආකාරය අවබෝධ කර ගැනීම.

**1.1 සමාලෝචනය**

මෙම අධ්‍යයනය මඟින් පුද්ගල පෞරුෂය වර්ධනය කෙරෙහි ප්‍රාථමික සමාජානුයෝජනය තුළින් සිදුවන බලපෑම සමාජයට ඇති කරන බලපෑම කෙබඳුද? යන්න සොයා බලන සිදු කළ අතර පර්යේෂණයේ පරමාර්ථයට අනුව යමින් ප්‍රාථමික සමාජානුයෝජන ක්‍රියාවලිය තුළින් පුද්ගල පෞරුෂය ඉහළ නැංවීමත්, ඒ තුළින් සමාජ ප්‍රගමනයට සියලු දෙනා දායක කර ගැනීම සමාජ ප්‍රගමනය කෙරෙහි සමාජානුයෝජන ක්‍රියාවලිය අත්‍යාවශ්‍ය බව හඳුනාගැනීම ,පවුල් සංස්ථාවේ ක්‍රියාකාරිත්වය තුළින් පුද්ගල පෞරුෂයට ඇතිවන බලපෑම අධ්‍යයනය කිරීම සහ සමාජ විපර්යාසයට සාපේක්ෂව පවුලේ සමාජිකයන්ගේ කාර්යභාරය වෙනස් වී ඇති ආකාරය අවබෝධ කර ගැනීමය යන අරමුණු අනුව යමින් පවුල් සංස්ථාවන් සිදු වන සමාජානුයෝජනය කොතරම් දුරට බලපාන්නේ ද යන්න පිළිබඳ සොයා බැලීම හා හඳුනාගත් නිගමනවලට අනුව ඒවාට විසඳුම් යෝජනා කිරීමත්ය මෙමගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව ප්‍රාථමික සමාජානුයෝජනය පුද්ගලයෙකුට ඉතා වැදගත් සමාජානුයෝජන කාරකයක් වශයෙන් හඳුනාගත හැකිය.

## 2.0 ක්‍රමවේදය

තෝරාගත් මාකඳුර-නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම තුළ පුද්ගල පෞරුෂය වර්ධනය කෙරෙහි ප්‍රාථමික සමාජානුයෝජනය තුළින් සිදුවන බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී දත්ත ලබා ගැනීමේ ක්‍රමය වශයෙන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතයට ගැනීම සිදුවන ලදි. ප්‍රමාණාත්මක දත්ත ලබා ගැනීමේ ශිල්ප ක්‍රම යටතේ ප්‍රශ්නාවලී ක්‍රමය යොදාගත් අතර පර්යේෂණ ප්‍රශ්නය මතු කර ගැනීමට හැකිවන පරිදි ගෘහ මූලික ඒකකයන්ට එය යොමු කිරීම සිදුවන ලදි. එසේම ප්‍රමාණාත්මක තොරතුරු යොදා ගැනීම පමණක් ප්‍රමාණවත් නොවන හෙයින් ගුණාත්මක තොරතුරු ලබා ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය ආදී වූ ශිල්ප ක්‍රමය යොදා ගන්නා ලදි. සමීක්ෂණ විධික්‍රමය පිළිබඳ වැඩි වශයෙන් අවධානය යොමු කරන ලදි. එහිදී මෙම නියැදි තුළ දී දත්තදායකයින්ගේ සාමාන්‍ය සමාජ සංස්කෘතික තොරතුරු, ඔවුන්ගේ හැඟීම් දැනීම් පිළිබඳ තොරතුරු එක් කර ගැනීම සිදු කරන ලදි. පුද්ගලයාගේ හැසිරීම, චර්යා, හා ආකල්ප පිළිබඳ ගුණාත්මක තොරතුරු අධ්‍යයනය කිරීම මෙම සම්මුඛ සාකච්ඡාව තුළින් සිදු කර ගනු ලැබිණි. ඒ අනුව,




මේ ආදි වශයෙන් පවුල් සංස්ථාව උපයෝගී කොට ගෙන එම පුද්ගල පෞරුෂ වර්ධනය ඇතිවන ආකාරය මේ තුළින් අධ්‍යයනය කර ඇත.

## 3.0 දත්ත විශ්ලේෂණය

සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ දෙමාපියන් හා දරුවන් අතර පවතින සම්බන්ධතාවය කොතරම් ද යන්න පිළිබඳව අධ්‍යයනය කළ අතර එය පවුල තුළ සිදු වන්නේ කිනම් ආකාරයකින් ද යන්න පිළිබඳව අධ්‍යයනය කෙරෙණි. දරුවන්ගේ සමීපව ඇසුරු කරන්නේ කවුරුන් ද යන්න පිළිබඳව හා ඔවුන් පිළිබඳව දෙමාපියන් තුළ පවතින්නේ කුමන ස්වරූපයක් ද යන්න පිළිබඳව ගෘහ ඒකක ඇසුරෙන් අධ්‍යයනය කිරීම සිදුවන ලදි. එමෙන් ම දරුවන් පාසල් අවසන් වී කාලය ගත කරන්නේ කවුරුන් සමඟ ද කුමන ක්‍රියාකාරකම් කරන්නේ ද යන්න පිළිබඳව අධ්‍යයන කිරීම වැදගත් සාධකයක් බවට වර්තමානයේ පත් ඇති අතර පවුලේ සාමාජිකයන්ගේ චර්යා රටාව හඳුනා ගැනීම හා ඒ තුළින් කොතරම් දුරට පුද්ගලයා සමාජානුයෝජනය වී තිබෙන්නේ කුමන ක්‍රියාකාරකම් මත ද යන්න එය දුස් සමාජානුයෝජනයක් ද නැතහොත් සුසමාජානුයෝජනයක් යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම සිදු කළ යුතුය. දෙමාපියන්ගේ ආර්ථික තත්වය දරුවන් සමාජානුයෝජනය වීමට කෙසේ බලපාන්නේ ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම මෙන්ම පවුල තුළ සහයෝගීතාවය කොතරම් දුරට බලපාන්නේ ද යන්න පිළිබඳ ව හා සාර්ථක පවුල් ජීවිතයක් ඇති කිරීමට අධ්‍යාත්මික, සමාජීය වශයෙන් පුද්ගලයා සමාජානුයෝජනය වන ආකාරය වැදගත් වන්නේ ද යන්න පිළිබඳව මේ තුළින් සිදු කිරීම කරන ලදි.

සම්මුඛ සාකච්ඡා මඟින් ලබාගත නොහැකි වූ බොහෝ තොරතුරු ලබා ගැනීමට නිරීක්ෂණ ක්‍රමය යොදා ගැනීම සිදු වූ අතර නිවසේ සිටින පුද්ගලයින්ගේ හැසිරීම, කතා කරනු ලබන භාෂාව, ඇඳුම් පැළඳුම් සහ අනෙකුත් වැඩිහිටියන් ට දක්වන ආචාරශිලිබව හෝ වෙනත් හේතුන් අධ්‍යයනය කිරීම තුළින් පුද්ගලයා කෙසේ සමාජානුයෝජනය වී තිබේ ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම සිදු වන ලදි. මේ හැරුණු විට පර්යේෂණයට අදාළ වූ පොත්පත් සඟරා පරිශිලනය කිරීමෙන් අනතුරුව සහ ග්‍රාම නිලධාරී කාර්යාලය ලබාගත් තොරතුරු ද්විතීයික මූලාශ්‍රයන් ලෙස භාවිතා කිරීම සිදු කරන ලදි.

ප්‍රාථමික සමාජානුයෝජනය දරුවන්ගේ චර්යා රටා සහ ආකල්ප හැඩගැසීම කෙරෙහි බලපාන ආකාරය සමාජානුයෝජන යන සිද්ධාන්ත, සමාජය, සංස්කෘතිය සහ පෞරුෂත්වය වැනි සංකල්පය සමාජ, මානව සහ මනෝවිද්‍යාත්මක සංකල්පයක් වශයෙන් සමාජානුයෝජන හා පවුල පිළිබඳ දක්වා ඇති අදහස් හඳුන්වා ඇත. දෙමාපියන්ගේ සහ දරුවන්ගේ කාර්යය කොටස් සකස් වී ඇති ආකාරය හා ප්‍රාථමික සමාජානුයෝජනයේ වැදගත් වීම කොතෙරම් අගනේ ද යන්න පිළිබඳව අධ්‍යයනය තුළින් පැහැදිලි කරගෙන ඇත.

යහපත් සමාජානුයෝජනයක් ඇති කිරීමේ පදනම වන්නේ යහපත් පවුල් සංස්ථාවක් වේ. පවුල ස්ථිතික සංස්ථාවක් වන බැවින් එයට සමාජීය, ආර්ථික හා සංස්කෘතික යනාදී සාධක බලපෑමක් ඇති කරනු ලබයි. සමාජ සංස්කෘතික වශයෙන් වෙනස් වන සමාජ පරිසරයට අනුව වෙනස් වෙමින් එයට අනුවර්තනය වීමට පුද්ගලයාට සිදු වී ඇත. වර්තමාන සමාජය තාක්ෂණය හා සම්බන්ධ වීමත් සමඟ මිනිස්කම පිළිබඳව ඇති හැඟීම මිනිසා තුළින් හින වී යාම දැක ගත හැකි ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකිය. මිනිසා සමාජගත වීමේ දී සමාජයේ තිබෙන ආචාර ධර්මයන් හා ගුණ ධර්මයන් පිරිහී යාමක් දක්නට ලැබේ. කෙසේ වුවද කුඩා කාලයේ සිට ම තරඟකාරී අධ්‍යාපනය හා ආර්ථික ජිවිතයට පුරුදු වී සිටින නිසා ආර්ථික ජීවිතය පරිහානියට පත් වී ඇත. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ දුස් සමාජානුයෝජනයකට පුද්ගලයා නැඹුරු වීමයි. පවුල් සංස්ථාව තුළ ඇති වන ඇතැම් තත්වයන් හේතු පාදක කරගෙන සමාජගත වන පුද්ගලයා මානසික වශයෙන් ව්‍යාකූලභාවය වැනි තත්වයක් වුවද ඇති විය හැකිය. මෙයට හේතු වී ඇත්තේ පවුල තුළින් ලැබිය යුතු සමාජානුයෝජනය නොලැබීම ආදි හේතු සාධක විය හැකිය.


දරුවන් යහ මඟට සඳහා සමාජානුයෝජන කාර්යය දෙමාපියන්ගෙන් සිදුවිය යුතු කාර්යයභාරය ලෙස සඳහන් කළ හැකිය. එය එකිනෙකට වෙනස් වන බව ද පෙන්වා දිය හැකිය. ඒ අනුව පවුලෙන් සමාජයට යන දරුවා නිසි ලෙස සමාජානුයෝජනය වී තිබීම අනිවාර්යය ලක්ෂණයක් බවට පත් වී ඇත. එසේ නොවුනහොත් සමාජ ප්‍රගමනය සිදු වීමට වඩා එමඟින් ඇති වනුයේ සමාජයට අනර්ථයක් වේ. දුස් සමාජානුයෝජනයක් සිදු වූ විට අපගාමී චර්යාවන් වර්ධනය වීමට ද වුව විය හැකිය. දරුවෙකුට සමාජානුයෝජනය වීමට දෙමාපියන්ගේ දායකත්වය අනිවාර්යය සාධකයක් බවට පත් ව ඇත. දෙමාපියන් ආර්ථික වශයෙන් ශක්තිමත් වනවා සේ ම දරුවන් සමාජගත වීමේ දී ඔවුන් අධ්‍යාපනික වශයෙන් සන්නද්ධ කිරීම කළයුතු දෙයක් ලෙස පෙන්වා දිය හැකිය. ඒ අනුව දරුවා සමාජගත වීමේ දී ඉතා වැදගත් සාධකයක් බවට පත් වී ඇත.

දෙමාපියන් දරුවන් නොතකා හැරීම හා දරුවා හුදකලාභාවයට පත් වීම හේතු කොට ගෙන සමාජානුයෝජනය වීමේ දී ඇතැම් විෂමතාවයන් ඇති විය හැකිය. කෙසේ වුවද දෙමාපියන් කාලයක් තිස්සේ ලඟ නොමැති වීම, ජීවත් වන සමාජ පරිසරය අප්‍රිය වීම, නොයෙකුත් පුද්ගලයන්ගේ සරදමට ලක් වීම, බිය වීම හෝ අපහාස වලට ලක් වීම, අන් අය හා සංසන්දනය කිරීම, කොන් වීම, තමන්ට ඇහුම්කන් දීමට කෙනෙක් නොමැති වීම, විශාදය

වැනි රෝග ඇති වීම, අධ්‍යාපනය හැර දා යාම, දරුවන්ට හොඳ නරක කියා දීමට කෙනෙකු නොමැති වී යාම, ආදරය, කරුණාව, සෙනෙහස නොලැබී යාම, ආදී හේතු කොට ගෙන මෙම තත්වයන් ඇති විය හැකිය. පුද්ගලයා තුළ මානසික අර්බුදයක් ඇති වීම මෙන් ම සමාජ විරෝධී වැඩවලට පෙළඹීම මව් සෙනෙහස අහිමි විම තුළ ඇතිවන තත්ත්වයක් ලෙස පෙන්වා දිය හැකිය. එමෙන්ම දරුවන්ගේ පෞද්ගලිකත්වය කෙරෙහි බලපාන ඉතා අහිතකර අත්දැකීම් අතර ආදරය හා ආරක්‍ෂාව ආදිය ද ප්‍රධාන වන්නකි. අවිශ්වාසය හා අනර්ථවත් බව ඇති කරන කලබලකාරී ස්වභාවය ද දූස් සමාජානුයෝජනයක් ඇති වීමට හේතු වී ඇත.

## 4.0 නිගමන

සමස්තයක් වශයෙන් ගත් විට පුද්ගලයා යහපත් ලෙස සමාජානුයෝජනය කිරීම හා ඒ තුළින් සමාජ ප්‍රගමනයට දායක කරගරනීමේ දී ප්‍රාථමික සමාජානුයෝජනය වැදගත් වන අතර ඒ අනුව එය බලපාන ආකාරය මෙසේ සම්පින්ඩනය කළ හැකිය.




## 5.0 යෝජනා

මෙම අධ්‍යයනයේ දී සමාජ ප්‍රගමනය සඳහා ප්‍රාථමික සමාජානුයෝජනයේ දී මතු වූ ගැටලුවලදී හඳුනාගත් නිගමන තුළින් පහත සඳහන් යෝජනාවලට එළඹිය හැකිය.

- දෙමාපියන්ගේ වැඩ කටයුතු කළමනාකරණය කරමින් දරුවන් පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම
- දරුවා සමඟ සුහඳශිලීව කටයුතු කිරීම ඔවුන් ආදරයෙන් රැක බලා ගැනීම කළ යුතුය.
- සමවයස් කණ්ඩායම් සමඟ පවත්වනු ලබන ආශ්‍රය පිළිබඳව නිරන්තරයෙන් සොයා බැලීම
- දරුවා නිරන්තරයෙන් යහපත් කටයුතුවල නිරත කිරීමට පවුල් පරිසරය සකස් කිරීම හා ධාර්මිකව කටයුතු කිරීමට මෙන්ම දහම් අධ්‍යාපනයට යොමු කිරීම.
- ගම තුළ එකතු වී සිදු කරන වැඩ සඳහා දරුවා යොමු කරවීම හා සහයෝගයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව දැනුවත් කර වීම.

- තාක්ෂණය අනුව කටයුතු කරනු ලැබුවා වුවද තම සංස්කෘතිය රැකෙන පරිදි කටයුතු කිරීමට දරුවා යොමු කරවීම.
- සන්නිවේදන මාධ්‍ය භාවිතය පිළිබඳව දැඩි අවධානය යොමු කර වීම හා ඒවා අත්‍යාවශ්‍යතාවය අනුව භාවිතා කිරීමට යොමු වීම.
- කුඩා කාලයේ සිට ළමයා තුළ වර්ධනය විය යුතු සමාජීය වර්ධනයට පවුල් පසුබිම, අසල්වැසියන්, පාසල, සමවයස් කණ්ඩායම්, වැදගත් වන හෙයින් දෙමාපියන් විසින් ළමයා තුළ සමාජීය වර්ධනයක් ඇති කිරීම වැදගත් කාර්යයක් ලෙස සැලකිය යුතුය.
- කුඩා කාලයේ සිට දරුවන් සුහඳව කතා කිරීම, දරුවන්ගේ අදහස් පිළිගැනීම, ඔහු වැදගත් පුද්ගලයෙකු යන හැඟීම දරුවා තුළ ඇති කිරීම.
- දරුවෙකුට කායික, මානසික හා සමාජීය නිරෝගීභාවය සඳහා මව් සෙනෙහස ඉතා වැදගත් සාධකයක් ලෙස හඳුනා ගත හැකි අතර දරුවන් කෙරෙහි මවගේ අවධානය වැඩි වීම සිදු විය යුතුය.
- ගමේ පවතින සංවිධානවල සාමාජිකත්වය ගැනීම හා එහි ක්‍රියාකාරී පුද්ගලයෙකු ලෙස කටයුතු කිරීමට අවශ්‍ය අවස්ථාව පවුල තුළින් ලබාදිය යුතුය.
- රටක ශිෂ්ටත්වය හා සමෘද්ධිමත්භාවය සඳහා දරුවා දුස්සමාජානුයෝජනයෙන් වලක්වා සුසමාජානුයෝජනයක් ඇති පුද්ගලයෙකු ලෙස සමාජගත කිරීම මව්පියන් මෙන් ම අනෙකුත් සමාජ ස්ථරායන් තුළින් සිදු කළ යුතු දෙයකි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

අමරතුංග, පී. (2003). සමාජානුයෝජනය සහ එහි න්‍යායාත්මක පසුබිම. සංයුක්ත ලිපි. කැලණිය විශ්වවිද්‍යාලය.

අමරතුංග, පී. (2009). සමාජ විද්‍යාවඃ ශාස්ත්‍රීය ලිපි. කැලණියඃ ඩීල් ප්‍රින්ට් සලුෂන් පුද්ගලික සමාගම.

අමරසේකර, ඩී. (1998). සමාජ විද්‍යා විමර්ශන, දිවුලපිටියඃ සරස්වතී ඕෆ්සෙට් ප්‍රින්ටර්ස්.

කරුණාතිලක, ආර්. කේ. (2000). පුද්ගල ස්වියත්ව වර්ධනය කෙරෙහි පවුල් සංස්ථාවේ බලපෑම පිළිබඳ සමාජ මනෝ විද්‍යාත්මක අධ්‍යයනයක්. සමාජීය විද්‍යා පීඨයේ දර්ශනය පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද අමුද්‍රිත නිබන්ධනය. කැලණිය විශ්වවිද්‍යාලය.

කරුණාරත්න, එච්. ඩබ්. (1991). සමාජ විද්‍යා පර්යේෂණ ලිපි. කැලණියඃ එම්පයර් මුද්‍රණාලය.

කුමාර, එච්. එන්. වී. ජේ. ඒ. (2001). පවුල හා විවාහය, මාතරඃ රුහුණ අධ්‍යයන කවය.

කුමාරි, කේ. එම්. (1999). ප්‍රාථමික සමාජානුයෝජන ක්‍රියාවලිය දරුවන්ගේ චර්යා රටා සහ ආකල්ප හැඩ ගැසීම කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්. සමාජීය විද්‍යා පීඨයේ සමාජ විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද අමුද්‍රිත නිබන්ධනයඃ කැලණිය විශ්වවිද්‍යාලය.

ගයන්ත, එන්, ඩී. පී. (2017). පෞරුෂය සහ පෞරුෂ සංවර්ධනය, හෙයියන්තුඩුවඃ ස්ට්‍රීම්ලයින් ඇඩ්ස් පබ්ලිෂර්ස්.

ජයසිංහ, ඒ. කේ. පී. (2005). සමාජ මානව විද්‍යා මූලධර්ම. කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

ජයතුංග, එන්. (2013). සමාජ විද්‍යා ලිපි. කඩවත: නුවණි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්.

නාගිත හිමි, (1998). සමාජ විද්‍යාවේ මූලිකාංග, කොළඹ: ඉන්ප්‍රින්ටා ඉන්ටනැෂනල්.

පල්ලියගුරු, එච්. (1998). සංස්කෘතිය සමාජය සහ පෞරුෂය. කොළඹ 10: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

රන්ජන්, පී. ඩී. ඩී. (2004). ශ්‍රී ලංකා සමාජයෙහි දාරක සමාජානුයෝජනය. වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.

රත්නපාල, එන්. (1986). සමාජ විද්‍යාවේ මූලධර්ම, කොළඹ: සීමසහිත ලේක් හවුස් පින්ටර්ස් පබ්ලිෂර්ස්.

විජේකෝන්, ඒ. ඩබ්. (2008). සමාජ මනෝවිද්‍යාව. පිළියන්දල: කර්තෘ ප්‍රකාශන.

විජේනායක, ඩබ්. පී. (2004). "දරුවාගේ පෞරුෂය වර්ධනයට කුටුම්භයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක් " සමාජීය විද්‍යා පීඨයේ දර්ශනය පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද අමුද්‍රිත ප්‍රකාශන නිබන්ධනය: කැලණිය විශ්වවිද්‍යාලය.

සුබසිංහ, ඩබ්. (2014). සමාජ විද්‍යාත්මක භාවිතයන්. රනාල: දකුණු ආසියානු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය.

හපුආරච්චි, පී. 2011 මූලික සමාජ විද්‍යා ප්‍රවේශය, රාජගිරිය: විනිවිද පබ්ලිෂර්ස් (පුද්.) සමාගම.

හේරත්, එච්. එම්. ඩී. ආර්. (1999). ඥාතිත්වය. මහරගම: තරංජී ප්‍රින්ටිස්.

Dollard, J.M, N.E. (1950). Personality and Psychotherapy. New York: Mc Graw Hill.

Mayers, G.D. (2005). Social Phychology. New York: McGraw-Hall Company